**ශීර්ෂය - 243 සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**2. මතය**

ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැය විෂයයන් 10 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.6,789,112,090 ක ප්‍රමාණයක් සියයට 2 සිට සියයට 257 දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් මඟින් වැඩි කරගෙන තිබුණි. | එකඟවේ. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) වැය විෂයයන් 14 ක් සඳහා වූ මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝජනය නොවීම හේතුවෙන් එකතුව රු.6,874,992,990 ක් හෙවත් මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 3 සිට සියයට 51 දක්වා වූ පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරු කිරීම් මඟින් ප්‍රතිපාදන අඩු කර තිබුණි. | එකඟවේ. | -එම- |
| (ඇ) වැය විෂයය අංක 243-1-1-45-1501-11 අඩු ආදායම්ලාභී ජනතාව සඳහා ආහාර සුරක්ෂිතතා වැඩසටහන සහ වැය විෂයය අංක 243-1-1-51-1504-11 යල කන්නය සඳහා රාජ්‍ය බැංකු මඟින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සඳහා ඔඩපණ ණය ලබා දීමට අදාල පොලී සහනාධාර රාජ්‍ය බැංකු වෙත ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සලසා නොගෙන මුදල් රෙගුලාසි මඟින් රු.84,756,000 කින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | එකඟවේ. 2023 වර්ෂයේ අගෝස්තු මස 14 දින අමාත්‍ය මණ්ඩල තිරණයක් අනුව වසර අවසාන භාගයේ ක්‍රියාත්මක වූ බැවින් ඇස්තමේන්තු සකස් කිරිමේ දී ඇතුළත් කර නැත. | -එම- |
| (ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02 (අ) ඡේද යටතේ දක්වා ඇති වැය විෂයයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය හැර අනෙකුත් සියලුම පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 06 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරීම සිදු කළ යුතු වුවත්, කපා හැර තිබුණේ සියයට 5.38 ක ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය. | එකඟවේ. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වැය විෂයයන් 05 ක් සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු. 50,168,500,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනයෙන් තොරව ඉතිරි වී තිබුණි. | එකඟවේ. ජාත්‍යාන්තර මූල්‍ය අරමුදල මගින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු මෙම වසරේ කර ගෙනයාම නිසා එකඟවූ පරිදි ආසියානු සංවර්ධන බැංකුව ණය මුදල් නිදහස් කිරීම නොකරන ලදී. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට වැය විෂයයන් 13 ක් සඳහා 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු.1,666,861,200 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,089,437,365 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී පැවතුණි. එය එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 ක සැලකිය යුතු පරාසයක් ගෙන තිබුණි. | අපේක්ෂා කළ පරිදි පොලී සහනාධාර ඉල්ලුම්පත් සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් අදාළ කාල පරිච්ඡේදය තුළ ගෙවීමට ඉදිරිපත් නොකිරීම | -එම- |

**2.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 14:11 වගන්තියට අනුව 23 වැනි පරිශිෂ්ටයේ දක්වා ඇති පරිදි ආපදා ණය ලබා දීමේදී විශ්‍රාම වැටුප පරිවර්තනය කිරීම සඳහා දෙනු ලබන අවලංගු කළ නොහැකි පොරොන්දු ප්‍රකාශයක් ලබා ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුල නිලධාරීන් 19 දෙනෙකු සඳහා ආපදා ණය රු.1,469,440 ක් ගෙවීම් කිරීමේදී ඉහත ප්‍රකාශය ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ණය මුදල වාරික සියයකින් ආපසු අයකර ගැනීමට ඉදිරි සේවා කාලයක් නොමැති නිලධාරීන්ගෙන් පමණක් ඉහත ප්‍රකාශය ලබාගත් අතර ඉදිරියේ දී සියළු නිලධාරීන් ගෙන් ඉහත ප්‍රකාශය ලබා ගැනීමට සටහන් කර ගතිමි. | ආයතන සංග්‍රහයේ අදාල වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවිම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සඳහා පුහුණු කිරීම් 2023 වර්ෂයේ අග භාගයේ දී පැවැත්වූ බැවින් | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවිම. |

| | | |
|---|---|---|
| ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්තිත්ව ලියාපදිංචිය, සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචිය, සැපයුම්කරුවන් ලියාපදිංචිය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කිරීම, මිල සැඳහුම් ක්‍රමයට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කර රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර 2023 වර්ෂයේ අවස්ථා 06 දී එකතුව රු.1,584,599 ක් වූ ප්‍රසම්පාදන අයිතමයන් මිල සැඳැහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි. | 2023 වර්ෂයේදී එම පද්ධතිය මඟින් ප්‍රසම්පාදන කටයුතු කිරීමට සිදු කිරීමට නොහැකිවිය. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත හා තත්‍ය කාර්යමණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 59 න් තනතුරු 10 ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක් ද ද්විතීයික මට්ටමේ තනතුරු 02 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක් ද විය. | ද්විතීක මට්ටමේ පුරප්පාඩු දෙකෙන් එක් පුරප්පාඩුවක් සම්පූර්ණ කර ඇති අතර, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු තුනෙන් පුරප්පාඩු දෙකක් සම්පූර්ණ කර ඇත. පවතින එක් රියදුරු පුරප්පාඩුව සඳහා පුරප්පාඩුවක් පවතින බවට ලිපියක් නිකුත් කර එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් සිටී. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල අංශ නැවත වරක් දැනුවත් කර එම පුරප්පාඩු හැකි විගස පුරවා ගැනීමට සටහන් කර ගතිමි. | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීම හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතු වීම. |